# පුරාණ ඇත්ගාල ගම්මානය බිහිවීම පිළිබඳ ඓතිහාසික විමර්ශනයක්
## (පනාමුර නින්දගම ආශ්‍රයෙන්)

එම්.පී.එන්.ඩී. බණ්ඩාර[1], ඒ.ආර්.එල්.ඩී. නිල්මිණි[2],එම්.පී.එස්. මධුවන්ති[3], ඒ.කේ.එම්.තරංගි[4], එම්.ඒ.එස්.එම්. මනතුංග[5], එන්.ටී.එස්.ඉරේෂා[6]

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය mahee0330@gmail.com
[2]ආර්ථිකවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය arldrathnayaka@gmail.com
[3]රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය mgshashikala1992@gmail.com
[4]ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය tharukathushan99@gmail.com
[5]රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය kshalikamadhuwanthi@gmail.com
[6]සමාජවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය isandhni407@gmail.com

ප්‍රමුඛ පදඃ හස්ති රාජයා, ඇත්ගාල, නින්දගම, දියබුබුළ, සංරක්ෂණය

### හැඳින්වීම

දීර්ඝ වූ ප්‍රෞඪ ඉතිහාසයක් උරුම කරගන්නා ලද ශ්‍රී ලාංකේය අතීත උරුමයන් අපගේ දෙනෙතට දෘශ්‍යමාන වන තරමට වඩා සැඟවී ඇති තරම විශාල ය. වර්තමාන නාගරීකරණය යටතේ සියලු පුරාවිද්‍යා උරුමයන් විනාශ වී යන අතර ලාංකීය ඉතිහාසය විශාල බේදවාචකයකට හසු වී තිබේ. ඒ අනුව මෙම විමර්ශණයේ දී පනාමුර ඓතිහාසික ඇත්ගාල ගම්මානය ද එවන් වූ සැඟව ගිය ගම්මානයක් බැව් පෙනේ. වර්ෂ 1950 දී පනාමුර හස්ති රාජයාට වෙඩිතබා මරා දැමූ පසුව ලාංකීය ඉතිහාසය තුළ සුවිශාල ආන්දෝලනයක් ඇතිකරන ලද බැව් අවිවාදිත ය. ඇත්ගාල ගම්මානය බිහිවූයේ කෙසේ ද? යන්න අධ්‍යයන ගැටලුව පදනම්කර ගෙන මෙම පර්යේෂණය සිදු වේ. එකල ඇතුන් අල්ලාගත් අලිගාල පවත්වා ගෙන ගිය ප්‍රදේශය පසුකාලීනව ඇත්ගාල ගම ලෙස ප්‍රචලිත විය. පුරාණ ඇත්ගාල ගම්මානය බිහිවීමට පාදක වන ලද හේතු කාරණා පිළිබඳ විමර්ශනය මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව ඇඹිලිපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් පනාමුර ග්‍රාමසේවා වසම තුළ මෙම ඇත්ගාල ගම්මානය පිහිටා තිබෙන අතර එය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඓතිහාසික ගම්මානයක් ලෙස නම් කර ඇත. ඇත්ගාල ගම්මානය පිහිටා තිබෙන භූගෝලීය පරිසරය ඉතා සශ්‍රීක වූ ගොවි බිමක් බව සුපිරික්ෂාකාරී ලෙස නිරීක්ෂණයේ දී තහවුරු වේ.

### ක්‍රමවේදය

මෙම පර්යේෂණය උදෙසා අධ්‍යයන ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රමය, ඉලක්කගත කණ්ඩායම් ක්‍රමය හා මූලාශ්‍ර අධ්‍යනය තුළින් ගුණාත්මක දත්ත රැස්කර ගන්නට පෙළඹුණි. ඉලක්කගත කණ්ඩායම ලෙසින් පනාමුර ශ්‍රී කාවන්තිස්ස රජ මහා විහාරයේ විහාරාධිපති හිමියන්, පනාමුර මහා විදුහලේ නූතන නියෝජ්‍ය විදුහල්පති තුමා සහ ඇත්ගාල ගම්වැසියෙකුවන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ විශ්‍රාමික අධ්‍යක්ෂකවරයෙකු ද තෝරාගෙන සම්මුක සාකාච්ඡා තුළින් අධ්‍යයනය සිදු කරන ලදී.

### ප්‍රතිඵල හා සාකච්ඡාව

ඓතිහාසික නගරයක් ලෙස නම්දරා තිබූ පනාමුර ප්‍රදේශය කන්ද උඩරට රාජ්‍ය ආරම්භයේදී දළඳා වහන්සේට පූජාකර තිබූ නින්ද ගමක් ලෙස ප්‍රසිද්ධ වේ. පනාමුර ප්‍රදේශයේ දිවි ගෙවී සොරෙකු වූ කටුවන කොටුවෙන් පලා ආවේයැයි

තොරතුරු ඉතිහාස ගත කරන ලද්දා වූ අතලවලයා නම් පෘතුගීසි සොරා මරාදමා ඔහු රජුට අල්ලා දීම හේතු කරගනිමින් පනාමුර නින්දගම මඩුවන්වෙල රටේ මහතාට සන්නසකින්ලබා දී ඇති බැව් තොරතුරු සඳහන් වේ. එලෙස ම තවත් විවිධ වූ ජනප්‍රවාද මෙම නින්දගම පිළිබඳ තොරතුරු විදහා දක්වයි. රජතෙමේ එකළ අතලවලා සැඟවී සිටින ලද අක්කර 7000ක් විශාල වූ පනාමුරේ ගම සතර මායිම් යොදා එකී මොහොට්ටාල වූ මඩුවන්වෙල දිසාවට සන්නසකින් පරිත්‍යාග කරන ලද බැව් මූලාශ්‍රයගත සාධක පවති. මෙම නගරය වල්බිහි වී තිබිය දී පනාමුර වැවේ සහ දිය බිබුලේ පිරිසිදු පැන් බී හුරු වූ වල් ඇත් රැළ පෙර පුරුද්ද පරිදි වර්ෂයක් පාසා නියම් සමයේ දිය බීමට මේ ප්‍රදේශට රැස් වූ බැව් සනාථ ය. පරලෝ සැපත් මඩුවන්වෙල රටේ මහතා ඇත්ගාල් කිරීම පිළිබඳ සවිසි වික්‍රමයන් පා අවසන් වූයේ ද දාගැබ් හතර මැද පිහිටි මේ අභය භූමිය තුළදී ය. ශ්‍රී දළඳා මාළිගාවට පිඳු නින්දගමක් වශයෙනුත් පැවතීමේ පූජ්‍ය භූමිය හස්ති පෝරකයක් ලෙස පැවතීම ඛේදජනකය. 1889 දී ප්‍රථම වරට ඇත්ගාල බැඳීම අරඹන ලද්දා වූ රටේ මහතා තම සිතැඟි පරිදි අලි දඩයම සහ අලි අලෙවි කිරීම සිඳුකරන ලද බැව් ජනප්‍රවාදයේ සඳහන් වේ . සෑම වසරකදීම අගෝස්තු මාසය තුළදී එනම් තද නියං කාලයේ දී ඇත්ගාල බැඳි අතර එය නොකඩවා 26 වතාවක් පනාමුර දිය බුබුළ ආසන්නයේ ඉදි වූයේ ගම්මුන්ගේ ශ්‍රමයෙනි. 1930 සැප්තැම්බර් මස මඩුවන්වෙල රටේ මහතා මිය ගිය පසුව 1950 දි අවසන් ඇත්ගාල ඉදි වුයේ ලංකාවේ ප්‍රථම කතානායක ධූරය හොබවන ලද්දා වූ සර් ෆ්‍රැන්සිස් මොලමුරේ මහතාගේ අනුදැනුමෙන් ය. ඇත්ගාල පැවැත්වීම උදෙසා ඉංග්‍රීසි ආණ්ඩුවට බදු ගෙවා බලපත්‍රයක් ලබාගත යුතු ය. එහෙත් මඩුවන්වෙල රටේ මහතා ඉංග්‍රීසි ආණ්ඩුවට කිසිදු බඳු මුදලක් ගෙවීම සිදු නොකළේ ය. බලපත්‍ර ලබා නොගෙනම තම තේජස පෙන්වමින් හිතුමතේට අලි ඇතුන් විකුණා වෙන්දේසි කරමින් අධික ලාබයක් උපයන ලඳ බැව් සම්මුඛ සාකච්ඡා අනුව තහවුරු කරගත හැකි විය. කරමැටිආරත්, කිතුලබොකු ඔයත් සම්බන්ධවන තැන් හි දිය බුබුළ පිහිටන ලද්දේ ය. කිසිදු කාලයක දී දිය නොසිඳි පැවති මෙම දිය බුබුළ සතා සීපාවා සහ ගහ කොළේ ජීව ගෘහය වු අතර ගැමියන් ගේ ජීවන ශික්ෂාව සකස් කරන ආධ්‍යයාත්මික ආලෝකය ට මුල් වී පැවත ඇත. මෙම දිය බුබුලට දිය බීමට ආ ඇත් සහ අලි රංචු ගාල් කරමින් තනන ලද්දා වූ ඇත්ගාල ඉතා සුප්‍රසිද්ධ විය. රටේ මහතා මෙම ඇත්ගාල පවත්වාගෙන යන ලද්දේ තම පෞද්ගලික වාසි තකාය. ඉන් ලද සියලු ආදායම ඔහු සතු විය. ඉතා රුදුරු පාලකයෙකු වූ මොහු තමාට ත්‍යාග ලෙස පිරිනමන ලද භූමිය තුළ තමාට අවශ්‍ය පරිදි අනසක පතුරුවන ලද බැව් මින් සනාථ වේ. ඇල්ල, වැඅතුර, බුලත්වැල්වත්ත, වලච්චත්ත, තඹලවෙළ ගම් වලට මායිම් ව පවතින මෙම බිම්කඩ ඓතිහාසික ගත වූයේ 1950 ඇත් ගාල තුළිනි. එකළ බඳින ලද්දා වූ ඇත්ගාල සඳහා උපදෙස් හා මූලපිරීම ෆ්‍රැන්සිස් මොලමුරේගෙන් වූ අතර චණ්ඩ ලෙස හැසිරෙන ලදැයි සඳහන් වන පනාමුර හස්තියා තම වර්ගයා වෙනුවෙන් මිනිසුන් හා හරිහරියට සටන් කරන ලද බැව් තොරතුරු ඉතිහාසගත වේ. තම වර්ගයා නිදහස් කරගනිමින් ඇත්ගාලෙන් මිදිමට තැත්කළ ද එය ව්‍යවර්ථ කරමින් පනාමුර හස්තියා සෑම් කදිරගාමර් මහතාගේ වෙඩි උණ්ඩයට හසු විය. මේ කිසිදු පුවතක් නොදන්නා තිරිසන් සත්ත්වයා තම වර්ගයා වෙනුවෙන් දිවි පුදන ලද පින් බිම පසුකාලීනව ඇත්ගාල ගම ලෙස ඓතිහාසික ගත වන්නට විය. මෙම ගම්මානය තුළ ඉතා දැවැන්ත ශක්තිවන්තයකු මරා දැමූ ඛේදවාචකයට ස්වභාවදහම දඬුවම් දෙන ලද බැව් ගම්මුන් විශ්වාස කරන ලදී. ඇත්ගාල

පාදක කර ගනිමින් එම ප්‍රදේශ ජනාවාස වූ අතර අලි වෙන්දේසිය සඳහා පැමිණි ජනතාව එම ප්‍රදේශවල දිවි ගෙවන ලද අතර අද වනතුරු ඔවුන් එහි දිවි ගෙවති. ඇත්ගාල අදවන විට විනාශවී ඇති අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කිසිදු ආකාරයකින් එය සංරක්ෂණය සිදු කර නැත. අලියා මරා දැමීම නිසා එම ප්‍රදේශ කාලයක් නිසරු ව පැවති බැවි ද ජනප්‍රවාදවල සඳහන් වේ. පුරාණ පනාමුර නින්දගම තුළ ඇත්ගාල බැඳි ගම්මාන ඇත්රජාගේ මරණයෙන් පසුකාලීනව ඇත්ගාල ගම්මානය ලෙස ව්‍යවහාර වූ බැව් ප්‍රචලිත වන ඓතිහාසික කාරණාවකි. නූතනය වන තුරු ද එම නමින් ගම්මානය ප්‍රචලිතය. මෙම ප්‍රදේශය හා ඇත්ගාල පැවති භූමිය රාජ්‍ය අනුග්‍රහය මත සංරක්ෂණය කිරීම උචිත හා අත්‍යාවශය බව මෙම පර්යේෂණය තුළින් පෙන්වාදිය හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


කහඳගමගේ, පියසේන. (1992)*පනාමුරේ ඇත් රාජා*.සරසවි ප්‍රකාශකයෝ.

විජිතනන්ද, කැලිගම. (2003)*කොළොන්නා කෝරළයේ ඉතිහාසය, මඩුවන්වෙල වලව්ව සහ ලංකාවේ කළු කුමාරයා*.කොළඹ:එස්. ගොඩගේ සහ සහෝදරයෝ.